**වවුනියාව දකුණ දෙමළ ප්‍රාදේශීය සභාව**

**වවුනියාව දිස්ත්‍රික්කය**

1. **මූල්‍ය ප්‍රකාශන**

1.1 **මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2020 පෙබරවාරි 28 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව හා විස්තරාත්මක කළමනාකරණ වාර්තාව පිළිවෙලින් 2020 ජුනි 23 දින හා 2020 ජූලි 22 දින සභාවේ සභාපතිවරයාට ඉදිරිපත් කර තිබුණි.

1.2 **තත්ත්වාගණනය කළ මතය**

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම් හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2019 දෙසැම්බර් 31 දිනට වවුනියාව දකුණ දෙමළ ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යයසාධනය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 **තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

(ආ) **ගිණුම්කරණ ප්‍රතිපත්ති**

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම** |
| --- | --- | --- |
| මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති සභාව විසින් මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කර නොතිබුණි. | ගිණුම්කරණ ප්‍රතිපත්ති මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කළ යුතුය. | මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති සභාව විසින් අමුණා ඇත. |

**(ආ)** **ගිණුම්කරණ අඩුපාඩු**

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම** |
| --- | --- | --- |
| සභාවේ වත්කම් පහක් භෞතිකව නොතිබුණි. කෙසේ වෙතත්, වර්ෂය අවසානයේ මූල්‍ය ප්‍රකාශනවලට වත්කම්වල වටිනාකම ඇතුළත් කර ඇති අතර, ඒ අනුව 2019 දෙසැම්බර් 31 දිනට වත්කම්වල වටිනාකම රු.1,794,960 කින් වැඩියෙන් දක්වා තිබුණි. | භෞතිකව පවත්නා වත්කම් පමණක් මූල්‍ය ප්‍රකාශනවල පෙන්විය යුතුය. | කපාහැරීම සඳහා අනුමැතිය ඉල්ලා ලිපිය යවා ඇත. |

**(ඇ) විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොතිබීම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| රු .177,314,653 ක් වටිනා ඉඩම් ගිණුම් පහක ඉඩම් හිමිකම් පිළිබඳ ඉඩම් ඔප්පු, ස්ථාවර වත්කම් ලේඛනය සහ ස්ථාවර තැන්පතු සහතිකය ඉදිරිපත් නොකිරීම නිසා විගණනයේදී සතුටුදායක ලෙස සහතික කළ නොහැකි විය. | ශේෂ සනාථ කිරීම සඳහා සාක්ෂි විගණනයට ඉදිරිපත් කළ යුතුය. | ඉඩම් ලේඛන ලබා ගැනීම සඳහා වන අයදුම්පත් ප්‍රාදේශීය ලේකම් වෙත යවා ඇත. කෙසේ වෙතත් කිසිදු ලියවිල්ලක් ලැබී නොතිබුණි. |

## 1.4 අනුකූල නොවීම්

### 1.4.1 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

| | නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම් | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|
| (අ) | 2018 අංක 19 දරණ ජාතික විගණන පනත 16 (2) උපවගන්තිය | මූල්‍ය ප්‍රකාශන සමඟ වාර්ෂික කාර්යසාධන වාර්තාව ඉදිරිපත් කර නොතිබුණි. | පනතේ උපදෙස් අනුව ක්‍රියා කළ යුතුය. | මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරියේදී ඉදිරිපත් කරනු ඇත. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි. | | | |
| | (i) මුදල් රෙගුලාසි 371 (5) | එකතු වටිනාකම රු. 200,815 ක් වූ අත්තිකාරම් 06 ක් සම්බන්ධයෙන් පසුගිය වසර දෙකක කාලය තුළ පියවර ගෙන නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු. | අත්තිකාරම් ගිණුම්වල ඇති රු.22,277 ක් කපාහැරීම සඳහා අනුමැතියට යවා තිබුණු අතර ඉතිරිය මිනින්දෝරු දෙපාර්තමේන්තුවට ගෙවූ මුදලකි. අත්තිකාරම් නිවැරදි කිරීමට පියවර ගන්නා ලෙස ඉල්ලා ලිපියක් අදාළ දෙපාර්තමේන්තුවට යවා ඇත. |

| | | | | |
|---|---|---|---|---|
| | (ii) මුදල් රෙගුලාසි 571 | වසර 02 කට වැඩි කාලයක සිට පැවති රු.214,455 ක් වූ තැන්පතු 08 ක් සම්බන්ධයෙන් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. | ඉල්ලීම ඉදිරිපත් නොකළ බැවින් එය ආපසු ගෙවා නොමැත. මුදල් රෙගුලාසි ප්‍රකාරව මේවන විට ප්‍රතිලාභීන් දැනුවත් කර එම ශේෂයන් ආදායමට ගැනීමට කටයුතු කරමින් පවතී. |
| (ඇ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය | | | |
| | (i) 178 (3) වගන්තිය | කොන්ත්‍රාත් කටයුතු ඵලදායී ලෙස සිදු කරන ප්‍රජා පාදක සංවිධාන සහ ප්‍රජා මධ්‍යස්ථානවල නම් ඇතුළත් ලේඛනයක් සකස්කර නොතිබුණි. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශය ප්‍රකාරව කටයුතු කළ යුතුය. | ලේඛණයක් නඩත්තු කිරීමට පියවර ගනු ලැබේ. |
| (ඈ) | 2017 ජුනි 28 දින වත්කම් කළමනාකරණ චක්‍රලේඛ අංක. 01/2017 | සභාවේ සියලුම වත්කම් ලේඛනගත කිරීමට පියවර ගෙන නොතිබුණි. | චක්‍රලේඛ උපදෙස් අනුව ක්ටයුතු කළ යුතුය. | වත්කම් සම්බන්ධ කාර්යයන් සම්බන්ධයෙන් වෙන්කල ලිපිගොනු සහ පොදු ලිපිගොනු පවත්වාගෙන යනු ලැබේ. |

## 2. මූල්‍ය සමාලෝචනය

----------------------

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

--------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.20,966,862 ක් වූ අතර ඊට අනුරූපී ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 13,392,468 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

-----------------------

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම, බිල්කළ ආදායම, රැස්කළ ආදායම හා හිඟ ආදායම

---------------------------------------------------------------------------------

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබුණු ඇස්තමේන්තුගත ආදායම, බිල්කළ ආදායම, රැස්කළ ආදායම හා හිඟ ආදායම් පිළිබඳ විස්තර පහත දැක්වේ.

| | ආදායම් ප්‍රභවය | 2019 | | | | 2018 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | | රු. | රු. | රු | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | 3,500,000 | 3,274,905 | 3,692,170 | 3,136,672 | 3,500,000 | 32,749,905 | 3,499,360 | 1,883,898 |
| (ii) | කුලී | 2,964,300 | 2,964,300 | 2,241,737 | 90,266 | 3,007,300 | 3,007,300 | 23,066,125 | 10,103 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 2,260,000 | 2,260,000 | 2,425,583 | - | 2,160,000 | 2,160,000 | 2,305,730 | - |
| (iv) | වෙනත් ආදායම් | 65,310,600 | 65,310,600 | 76,446,076 | 49,499,485 | 62,913,716 | 62,913,716 | 45,192,887 | 20,944,685 |
| | එකතුව | **74,034,900** | **73,809,805** | **84,805,566** | **52,726,423** | **71,581,016** | **100,830,921** | **74,064,102** | **22,838,686** |

## 2.2.2 ආදායම් රැස් කිරීම පිළිබඳ කාර්යසාධනය

| විගණන නිරීක්ෂණ | නිර්දේශ | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) අයවැය ඇස්තමේන්තුව නිසියාකාරව සකස් කර නොතිබීම සහ ඇස්තමේන්තු නිසි පරිදි සැලසුම් කර වැඩසටහන්ගත කර නොතිබූ හේතුවෙන් අයවැයගත ආදායම සහ තත්‍ය ආදායම අතර වෙනස රු.145,730 සිට රු.3,111,802 දක්වා වූ බව විගණනයේදී නිරීක්ෂණය විය. | අයවැය නිසි ලෙස සකස් කළ යුතුය. | අනාගතයේ එවැනි වෙනස්කම් නොමැතිව අයවැය සකස් කරනු ඇත. |
| (ආ) පසුගිය වසර 29 කට වඩා වැඩි කාලයක සිට සභාවට ලැබිය යුතු ආයුර්වේත පරිත්‍යාගයක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණු රු.38,280 ක මුදලක් සඳහා හේතු නොලැබීම හේතුවෙන් අයවැය පිළිගැනීමට හෝ සහතික කිරීමට නොහැකි විය. | හිඟ මුදල් අය කර ගැනීමට සභාව විසින් පියවර ගත යුතුය. | කපාහැරීම සඳහා ඉල්ලීමේ ලිපිය අනුමැතිය සඳහා යවා ඇත. |

## 2.2.3 වරිපනම් හා බදු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| දේපල බදු අනුපාතයන් වසර 08 කට වැඩි කාලයක් තිස්සේ නැවත තක්සේරු කර නොමැති අතර ඉතිරි දේපල බදු අනුපාත සතුටුදායක ලෙස පිළිගෙන තහවුරු කළ නොහැකි වීම, එකතු කිරීමට හේතු සතුටුදායක ලෙස හඳුනාගැනීමට නොහැකිවීම හේතුවෙන් | හිඟ වරිපනම් ගාස්තු සහ බදු අයකර ගැනීමට පියවර ගත යුතුය. | නැවත තක්සේරු කිරීමක් ඉල්ලා තක්සේරු දෙපාර්තමේන්තුවට නැවත නැවත ලිපි යවා තිබුණද, නැවත තක්සේරුවක් නොකළ අතර නුපුහුණු නිලධාරියෙකු විසින් අදාල වර්ෂයේ හිඟ මුදල් එකතු කළ අතර හිමිකරුවන් |

| | | |
|---|---|---|
| එකතුව රු.2,235,999 ක වරිපනම් සහ දේපල බදු හිඟ මුදල් එකතු කිරීම සඳහා පසුගිය වසර 01 සිට 05 දක්වා කාලය තුළ සභාව විසින් කිසිදු ඵලදායී පියවරක් ගෙන නොමැති බව නිරීක්ෂණය විය. | | දේපලහි පදිංචිව නොසිටීම හේතුවෙන් හිඟ මුදල්ද එකතු කර ගැනීමට නොහැකි විය. |

### 2.2.4 වෙනත් ආදායම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාවට අයත් J.C.P මෝටර් ග්‍රේඩරය හා මෝටර් රෝලරය පසුගිය වසර 01 සිට 06 දක්වා කාලය තුළ කුලියට දීමෙන් අයකර ගැනීමට ඇති එකතු වටිනාකම රු.504,252 ක් වූ හිඟ ආදායම් වර්ග 27 ක් අයකර ගැනීමට අර්ථවත් ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | හිඟ ආදායම අය කර ගැනීමට අර්ථවත් ක්‍රියාමාර්ග ගත යුතුය. | සභාවට අයත් JCP, මෝටර් ග්‍රේඩර් සහ රෝඩ් රෝලර් කැම්බර්ලියා ව්‍යාපෘතිය යටතේ කුලියට ගෙන තිබුණි. දැනට ගෙවීම් සිදු කරන අතර වාහන කුලියෙන් සියයට 90 කට වැඩි ප්‍රමාණයක් අය කර ගෙන ඇත. |

### 2.2.5 උසාවි දඩ මුදල් සහ මුද්දර ගාස්තු

#### (අ) උසාවි දඩ මුදල්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2019 දෙසැම්බර් 31 දිනට පළාත් සභා ප්‍රධාන ලේකම් සහ සියලු බලධාරීන්ගෙන් ලැබියයුතු මුළු දඩ මුදල රු. 19,295,513 ක් විය. | නියමිත කාල සීමාව තුළ හිඟ මුදල් අය කර ගැනීමට පියවර ගත යුතුය. | වර්තමාන වර්ෂයේ උසාවි දඩ මුදල් ලබන වසරේදී අඛණ්ඩව අය කර ගැනීම සාමාන්‍ය සිරිත විය. |

#### (ආ) මුද්දර ගාස්තු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2019 දෙසැම්බර් 31 දිනට පළාත් සභා ප්‍රධාන ලේකම් සහ සියලු බලධාරීන්ගෙන් රු. 5,706,476 ක මුද්දර ගාස්තු අයකර ගතයුතුව පැවතුණි. | නියමිත කාල සීමාව තුළ හිඟ මුද්දර ගාස්තු අය කර ගැනීමට පියවර ගත යුතුය. | වර්තමාන වර්ෂයේ මුද්දර ගාස්තු ලබන වසරේදී අඛණ්ඩව අය කර ගැනීම සාමාන්‍ය සිරිත විය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්යසාධනය

මහජන සෞඛ්‍ය, මහජන උපයෝගීතා සේවා සහ මහජන මංපෙත් විධිමත් කිරීම සහ සුවපහසුව, පහසුව සහ ජනතාවගේ සුභසාධනය වැනි කාරණා විධිමත් කිරීම සහ පාලනය කිරීම වැනි ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ ක්‍රියාත්මක කළ යුතු ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් නිරීක්ෂණය කළ කරුණු පහත දැක්වේ.

**(අ) අතුරු ව්‍යවස්ථා**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ප්‍රාදේශීය සභා පනතේ 126 වන වගන්තිය ප්‍රකාරව ප්‍රධාන කාර්යයන් 30 ක් සඳහා අතුරු ව්‍යවස්ථා පැනවිය යුතු විය. නමුත් 2017 දෙසැම්බර් 31 වන විට පවා කාර්යයන් 19 ක් සඳහා අතුරු ව්‍යවස්ථා පනවා තිබුණි. | ප්‍රදේශ් සභා පනතේ 126 වන වගන්තිය ප්‍රකාරව ප්‍රධාන කාර්යයන් 30 ක් සම්බන්ධයෙන් අතුරු ව්‍යවස්ථා පැනවිය යුතුය. | අතුරු ව්‍යවස්ථා 19 ක් සිදු කර ඇත්තේ විගණනයට අදාළ බැවිණි. |

**(ආ) කාර්යයන් අවසන් කිරීමට ප්‍රමාද වීම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාව විසින් ක්‍රියාත්මක කරන ලද රු.12,952,000 ක් වටිනා කාර්යයන් 09 ක් ක්‍රියාත්මක කිරීමේ ප්‍රමාදයන් නිරීක්ෂණය විය. | කටයුතු නියමිත කාල සීමාව තුළ සම්පූර්ණ කළ යුතුය. | නියමිත දිනට ගෙවීම් සඳහා අරමුදල් නොලැබුණි. මේ වනවිට ගෙවීම් සිදුකරණු ලැබේ. |

**(ඇ) ඝන අපද්‍රව්‍ය කළමනාකරණය**

| | විගණන නිරීක්ෂණ | නිර්දේශ | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම් |
|---|---|---|---|
| (i) | කසළ බැහැර කරන ස්ථාන සඳහා පාරිසරික බලපත්‍ර ලබාගෙන නොමැත. | බලපත්‍ර ලබා ගත යුතුය. | ඉඩම් නිෂ්කාශනය ලබාගැනීමට නොහැකිවීම හේතුවෙන් පාරිසරික බලපත්‍ර ලබා ගත නොහැකි විය. අයිතිය පැවරුවහොත් ක්‍රමානුකූලව පසු විපරම් ක්‍රියාමාර්ග ගනු ලැබේ. |

| | | | |
|---|---|---|---|
| (ii) | සනීපාරක්ෂක කම්කරුවන් වාර්ෂිකව වෛද්‍ය පරීක්ෂණයකට භාජනය කර නොතිබුණි. | සනීපාරක්ෂක කම්කරුවන් වාර්ෂිකව වෛද්‍ය පරීක්ෂණයකට භාජනය කළ යුතුය | අතීතයේ එක් වරක් වෛද්‍ය පරීක්ෂණයක් සිදු කර තිබුණි. මෙම ක්‍රියාව අනාගතයේ දී අඛණ්ඩව අනුගමනය කරනු ඇත. |
| (iii) | කසළ වෙන වෙනම වර්ගීකරණය කොට එකතු කර නොතිබුණි. | කසළ වර්ගීකරණය කර එකතු කළ යුතුය. | අප විසින් එකතු කරන ලද අපද්‍රව්‍ය බොහොමයක් කොම්පෝස්ට් කළ හැකි අපද්‍රව්‍ය ලෙස වර්ගීකරණය නොකර එකතු කර බැහැර කරනු ලැබේ. කෙසේ වෙතත් දැනට අපද්‍රව්‍ය වර්ග කර එකතු කිරීම පිළිබඳව සාකච්ඡා කෙරෙමින් පවතී. |
| (iv) | කුණු කසළ බැහැර කරන ස්ථානයට ගෙන එනු ලබන කසළ වර්ගීකරණය කිරීමේ වැඩ පිළිවෙලක් සභාව විසින් ක්‍රියාත්මක කර නොතිබුණි. | කසළ වර්ගීකරණය සඳහා සභාව විසින් වැඩ පිළිවෙලක් සකස් කළ යුතුය. | අපද්‍රව්‍ය දිනකට කිලෝග්‍රෑම් 1000 ත් 1500 ත් අතර ප්‍රමාණයක් අප විසින් බැහැර කරනු ලබන අතර එයින් සියයට 90 ක්ම අපද්‍රව්‍ය බැහැර කරන ස්ථානයේ බැහැර නොකර කොම්පෝස්ට් කළ හැකි අපද්‍රව්‍ය වේ. තවද, ඝණ අපද්‍රව්‍ය බැහැර කිරීමේ ව්‍යාපෘතිය සඳහා සභාව තුළ අරමුදල් හිඟයක් පවතී. |
| (v) | නිලධාරීන්ට අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ පුහුණුවක් ලබා දී නොතිබුණි. | නිලධාරීන්ට අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ පුහුණුව ලබා දිය යුතුය. | අතීතයේ දී පුහුණුව ලබා දී ඇති නමුත් මෑත කාලයේ දී එය ලබා දී නැතත්, එය ලබා දීමට ඉල්ලීමක් ඉදිරිපත් කර ඇත. ළඟදීම දෙපාර්තමේන්තුමය පුහුණුවක් ලබා දෙනු ඇත. |
| (vi) | අපද්‍රව්‍ය කළමනාකරණයට අවශ්‍ය තොරතුරු හා දත්ත පද්ධතිය නඩත්තු කර නොතිබුණි. | අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ දත්ත හා තොරතුරු ක්‍රමානුකූලව සකස් කළ යුතුය. | අනාගතයේදී දත්ත පද්ධතිය නඩත්තු කිරීමට පියවර ගන්නා බව කරුණිකව ඔබට දන්වමි. |
| (vii) | ප්‍රතිචක්‍රීකරණයට භාජනය කිරීමෙන් තොරව පරිසරයට හානි වන අයුරින් ඝන අපද්‍රව්‍ය ගිනි තබා තිබුණි. | ඝන අපද්‍රව්‍ය ප්‍රතිචක්‍රීකරණයට භාජනය කළ යුතුය. | ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය සඳහා සුදුසු යාන්ත්‍රණයක් වැඩිදියුණු කිරීමට විශාල අරමුදල් ප්‍රමාණයක් අවශ්‍ය වීම සහ ජාතික සැලසුම් ආකෘතියක් නොමැතිවීම හේතුවෙන් පළාත් පාලන ආයතන විශාල අභියෝගයකට මුහුණ දී සිටී. දිනපතා ඉවත් කරනු ලබන කසළ ප්‍රමාණය අඩු කිරීම සඳහා ගිනි තැබිය යුතු වුවද මේ සඳහා විකල්ප සැලැස්මක් ඉක්මනින් ක්‍රියාත්මක කරනු ලබන බව ඔබට දන්වනු කැමැත්තෙමි. |

## 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණ | නිර්දේශ | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම් |
| --- | --- | --- |
| 2019 දෙසැම්බර් 31 දින වන විටත් ණය හිමියන් 04 ක ගෙන් රු.949,000 ක මුදලක් පියවා ගැනීමට අර්ථවත් ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | ණය ගැතියන්ගේ හිඟ මුදල් පියවිය යුතුය. | වර්ෂය අවසානයේදී ගෙවීම සිදු කිරීමට නියමිත නමුත් ගෙවීම් වවුචර් නොමැති නිසා ගෙවීම් කර නොතිබුණි. |

## 3.3 මානව සම්පත් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- | --- |
| (අ) | **පුරප්පාඩු** | | |
| | 2019 දෙසැම්බර් 31 දින වන විට සභාවේ කාර්යමණ්ඩල පුරප්පාඩු හතක් පුරවා නොතිබුණි. | නියමිත කාල සීමාව තුළ සභාව විසින් පුරප්පාඩු පිරවීමට පියවර ගත යුතුය. | නියමිත තනතුරු සඳහා සම්මුඛ පරීක්ෂණ පවත්වා තිබුණි. මෙම පුරප්පාඩු පිරවීමට පියවර ගනු ලැබේ. |
| (ආ) | **සේවක ඇප තැන්පතු** | | |
| | නිලධාරීන් තිදෙනෙකු සභාවෙන් ඉල්ලා අස්වී දීර්ඝ කාලයක් ගතව තිබුණි. කෙසේ වෙතත්, 2019 දෙසැම්බර් 31 දින වන විට සභාවේ සේවක ඇප තැන්පතුවල ඇතුළත් රු.12,500 ක මුදලක් ආපසු ගෙවීමට පියවර ගෙන නොතිබුණි. | ඇප මුදල් ආපසු ගෙවීමට පියවර ගත යුතුය. | රැකියාවෙන් විශ්‍රාම ගත් සේවකයාගේ ආරක්ෂක මුදල් මේ වන විට ආපසු ගෙවීමට පියවර ගෙන තිබේ. |

## 3.4 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- | --- |
| (අ) | පසුගිය වසර 12 ක කාලය තුළ සභාවේ විෂය පථය යටතේ වූ දේපල නැවත තක්සේරු කිරීම සහ දේපල සඳහා තක්සේරු බද්ද අයකර ගැනීම සඳහා අර්ථවත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | දේපල නැවත තක්සේරු කර දේපල සඳහා තක්සේරු බද්ද අයකර ගැනීම සඳහා පියවර ගත යුතුය. | දැනට දේපල බදු එකතු කරනු ලබන ගමට අයත් දේපළ නැවත තක්සේරු කිරීම සඳහා ලිපියක් යවා ඇත. තවම ඇගයීම් කර නොතිබුණි. |

| | | |
|---|---|---|
| (ආ) ගොඩනැගිලි 610 ක් සඳහා සභාව විසින් අනුමැතිය ලබා දී තිබුණි. කෙසේ වෙතත්,පාර්ශව 165 කට පමණක් අනුකූලතා සහතික ලබාදී තිබුණි. පසුගිය වසර 7 තුළ පාර්ශවයන් 445 කට අනුකූලතා සහතික නිකුත් කිරීමට පියවර ගෙන නොතිබුණි. | අනුකූලතා සහතික නිකුත් කිරීමට පියවර ගතයුතුය. | අයදුම්කරුවන් 445 කගේ අයදුම්පත් අතරින් සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී විසින් සමහරක් නිර්දේශ කර නොතිබුණි. සමහර අයදුම්කරුවන් ගොඩනැගිලි ඉදිකිරීම් සම්පූර්ණ කර නොමැති අතර අනුකූලතා සහතිකය සඳහා ඉල්ලුම් පත්‍රය ඉදිරිපත් කර තිබුණි. |

## 3.5 වත්කම් කළමණාකරනය

---------------------------

### 3.5.1 නඩත්තු හා අළුත්වැඩියා කිරීමට අසමත් වීම

----------------------------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| මේ දක්වා සභාවේ වාහන 04 ක් භාවිතා කිරීමට පියවර ගෙන නොතිබුණි. | ඒවා භාවිතයට ගත හැකි ආකාරයෙන් අලුත්වැඩියා කර භාවිතයට ගත යුතුය. | අංක. 144-8379 දරන වාහනය භාවිතයට ගත හැකි පරිදි අළුත්වැඩියා කර ඇත. අනෙක් වාහන 03 හි අයිතිය මාරු කිරීමේ කටයුතු සිදු කරමින් පවතී. අයිතිය මාරු කිරීමෙන් පසු ඉදිරි ක්‍රියාමාර්ග ගනු ලැබේ. |

### 3.5.2 පවරානොගත් වත්කම්

------------------------

| විගණන නිරීක්ෂණ | නිර්දේශ | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම් |
|---|---|---|
| (අ) සභාව භාවිතා කරන ඉඩම් 61 ක අයිතිය සභාවට පවරා ගෙන නොතිබුණි. | ඉඩම්වල අයිතිය සභාවට පවරා ගැනීමට පියවර ගත යුතුය. | සභාවට අයත් සියලුම ඉඩම් සඳහා ලිපි ලේඛන නිකුත් කරන ලෙස ඉල්ලා මේ වන විටත් ප්‍රාදේශීය ලේකම් වෙත ලිපියක් යවා ඇත. |
| (ආ) පරිත්‍යාගයක් ලෙස ලැබුණු වාහන අටක් සභාවට අයත් නොවීය. | වාහනවල අයිතිය පවරා ගැනීමට සභාව පියවර ගත යුතුය. | පරිත්‍යාග කරන ලද වාහන 08 ක අයිතිය සභාවට පැවරීමට කටයුතු කරමින් සිටී. |

## 3.5.3 ඌන උපයෝජිත වත්කම්

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සභාව විසින් 2015 මාර්තු 09 වන දින රු.577,095 ක වියදමින් නිශ්චිත සංවර්ධන ප්‍රදාන වැඩ යෝජනා ක්‍රමය යටතේ ක්‍රීඩා පිටියේ පිවිසුම් ගේට්ටුව අසල නාම පුවරුවක් ඉදිකිරීම අවසන් කර තිබුණි. කෙසේ වෙතත්, ක්‍රීඩා පිටිය සභාවට අයත් නොවූ බැවින් මෙම වාර්තාවේ දිනය දක්වා ක්‍රීඩා පිටිය භාවිතා කර නොතිබුණු අතර මේ දක්වා එහි අයිතිය පවරා ගැනීමට කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | ක්‍රීඩා පිටියේ හිමිකාරිත්වය පවරාගෙන එය භාවිතා කළ හැකි ආකාරයට සකස් කර භාවිතයට ගතයුතුය. | කැපකළ සංවර්ධන පරිත්‍යාග අරමුදල යටතේ ඉදිකරන ලද ඕමන්තෙයි ක්‍රීඩා සංකීර්ණයේ ඉඩම් අයිතිය පැවරීම සම්බන්ධයෙන් උතුරු පළාත් පළාත් ඉඩම් කොමසාරිස් වෙත ප්‍රාදේශීය ලේකම් විසින් යවා ඇති බව සඳහන් ලිපියේ පිටපතක් අප වෙත ලැබී තිබුණි. ඉඩම් හිමිකම ලැබීමෙන් පසු මහජනයා වෙත පැවරීමට පියවර ගනු ලැබේ. |
| (ආ) | සංවර්ධන ප්‍රදාන වැඩ සැලැස්ම යටතේ සභාව විසින් සිදු කරන ලද කෝමාරසන්කුලම් උද්‍යානයේ රු. 2,002,345 ක වියදමින් සිදුකළ ඉදිකිරීම් කටයුතු 2015 දෙසැම්බර් 07 දින අවසන් කරන ලදී. කෙසේ වෙතත්, එය මේ දක්වා භාවිතා කර නොතිබුණි. | උද්‍යානය භාවිතා කිරීමට පියවර ගත යුතුය. | අපගේ සභාව සඳහා නොමිලේ ආයුර්වේද වෛද්‍ය සේවාවක් කෝමාරසන්කුලම් මහජන උද්‍යානයේදී පවත්වනු ලැබේ. මේ වන විට සභාව විසින් සම්මත කරන ලද යෝජනාවට අනුව ඔසු උයන පිහිටුවා ඇත. |

## 4. ගිණුම් කටයුතු භාවය සහ යහපාලනය

### 4.1 අයවැය පාලනය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ඇස්තමේන්තුව නිසිලෙස සැලසුම් කර වැඩසටහන් ගත කර නොතිබුණු අතර අයවැය ඇස්තමේන්තුව නිසියාකාරව සකස් කර නොමැති වීම හේතුවෙන් අයවැයගත වියදම සහ තථ්‍ය වියදම අතර රු. 01 සිට රු.3,077,694 ක් දක්වා විචලනයන් සිදුවිය. | අයවැය ඇස්තමේන්තුව නිසි ලෙස සකස් කළ යුතුය. | අනාගතයේ එවැනි වෙනසක් සිදු නොවන ලෙස අයවැය සකස් කරනු ඇත. |